# එකොළහ ශ්‍රේණියේ සිසුන් ක්‍රීඩාවට සම්බන්ධ නොවීම පිළිබද සිසුන්ගේ ආකල්පමය බලපෑම

*ජේ.ටී.පී.එම්. ධර්මසේන* [1]

තරඟකාරී ජීවන රටාවක් තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ තරඟකාරිත්වය දැනුම පදනම් කරගත් අධ්‍යාපනයක් නිර්මාණය කර ඇත. මෙම අධ්‍යයනයෙන් පාසල්වල එකොළොහ ශ්‍රේණියේ සිසුන් ක්‍රීඩවට සම්බන්ධ නොවීම කෙරෙහි සිසුන්ගේ ආකල්පමය බලපෑම විමර්ශනය කරන ලදී. මෙම අධ්‍යයනයේ අරමුණු වූයේ ශ්‍රී ලංකාවේ තලාව අධ්‍යාපන කොට්ඨාශයේ එකොළහ ශ්‍රේණියේ සිසුන් ක්‍රීඩාවට සම්බන්ධ නොවීම පිළිබද සිසුන්ගේ ආකල්පමය බලපෑම් සෙවීම හා එකොළහ ශ්‍රේණියට පිවිසීමේදී ක්‍රීඩාවෙන් ඉවත් වීමට සිසුන්ට දෙමාපියන්ගෙන්, ගුරුවරුන්ගෙන් සහ පාසලෙන් එල්ල වන පීඩනයේ මට්ටම සොයා බැලීම එම බලපෑම් හැසිරවීමට විකල්ප ක්‍රම සෙවීම, සිසුන්ගේ අධ්‍යාපනික අභිප්‍රායන් මට්ටම මැනීම, ක්‍රීඩාවේ නියැලෙන සිසුන්ගේ සහ ක්‍රීඩා නොකරන සිසුන්ගේ අධ්‍යාපන අභිප්‍රායන්හි වෙනස හඳුනා ගැනීම සහ ක්‍රීඩා සහභාගීත්වය සහ අධ්‍යාපන තෘප්තිය අතර සම්බන්ධය හඳුනා ගැනීමයි.තලාව අධ්‍යාපන කොට්ඨාශයේ එකොළහ ශ්‍රේණියේ සිසුන් ක්‍රීඩාවට සම්බන්ධ නොවීම පිළිබද ආකල්පමය බලපෑම් හඳුනා ගැනීම සිදු විය. තලාව කොට්ඨාශයේ පාසල් 10 ක එකොළහ ශ්‍රේණියේ සිසුන් 200 (භ=200) දෙනෙකුගේ අහඹු නියැදීමක් යොදා ගෙන ඇත. ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන ද්විත්ව ප්‍රවේශයම මේ සඳහා යොදා ගෙන ඇත.දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා භාවිතා කළ අතර වගු,තීර ප්‍රස්තාර සහ වක්‍ර ප්‍රස්තාර මිනි ටැබ් (එදාබදාඒ‍ඉ 14 ) සහ එක්සෙල් (ඊ ෑජැක )හරහා ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය කරන ලදී. තලාව අධ්‍යාපන කොට්ඨාශයේ එකොළහ ශ්‍රේණියේ සිසුන් ක්‍රීඩාවට සම්බන්ධ නොවීම පිළිබද සිසුන්ගේ ආකල්පමය බලපෑම් සාධක සොයා ගෙන ඇත. පර්යේෂකයා විසින් රැස් කරන ලද දත්ත විශ්ලේෂණය කිරීම තුළින් පර්යේෂණයේ අරමුණු හඳුනාගෙන ඇත. තලාව අධ්‍යාපන කොට්ඨාශයේ එකොළහ ශ්‍රේණියේ සිසුන්ට සීමා වී ඇති ආකල්පමය බලපෑම් සාධක විශ්ලේෂණය කළ දත්ත මගින් පැහැදිලිව ප්‍රකාශ කර ඇත. සහභාගීත්ව පරිමාණය සහ පර්යේෂකයා විසින් විශ්ලේෂණය කරන ලද ප්‍රතිඵලය අනුව පෙනී යන්නේ තලාව කොට්ඨාශයේ එකොළහ ශ්‍රේණියේ සිසුන් සාමාන්‍ය පෙළ විභාග කාලය තුළ සිසුන්ගෙන් 13% ක් ක්‍රීඩාවට සහභාගී වීමේදී මධ්‍යස්ථ සීමාවන්ට මුහුණ දෙන අතර සිසුන්ගෙන් 86% ක් සහභාගී වීමේදී දැඩි සීමාවන් ඇති බවයි. තලාව අධ්‍යාපන කොට්ඨාශයේ එකොළහ ශ්‍රේණියේ සිසුන්ගෙන් 1% ක් සහභාගීත්වය සීමා කිරීම ලෙස දක්වා තිබේ. ලකුණුවල සාමාන්‍යය 38.5 ක් වන අතර එයින් පෙන්නුම් කරන්නේ තලාව අධ්‍යාපන කොට්ඨාශයේ එකොළහ ශ්‍රේණියේ සිසුන්ට ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පෙළ විභාග ක්‍රමය මගින් දැඩි ක්‍රීඩා සහභාගීත්ව සීමාවන් ඇති බවයි. මෙම පර්යේෂණ ප්‍රතිඵලවලට අනුව සාමාන්‍ය පෙළ විභාග ක්‍රමයේ පවතින ඉහළ තරගකාරිත්වය අවම කර සිසුන්ට ක්‍රීඩා කටයුතුවලට සහභාගි වීමට අවස්ථාව ලබාදීමට රජය කටයුතු කළ යුතුය. ක්‍රීඩා ක්‍රියාකාරකම්වල වැදගත්කම සහ අධ්‍යයන සඳහා එහි දායකත්වය පිළිබඳව දෙමාපියන්, ගුරුවරුන් සහ ප්‍රජාව දැනුවත් කිරීම අවශ්‍ය වන අතර එවිට ඔවුන් ස්වයංක්‍රීයව තම සිසුන් ක්‍රීඩා හා ශාරීරික ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීමට උනන්දු කරනු ඇත.

***ප්‍රමුඛ පදඃ*** ක්‍රීඩා, සහභාගීත්වය ,ආකල්ප , එකොළොහ ශ්‍රේණිය, සිසුන්

---

[1] සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.